**මැතිවරණ කොමිෂන් සභාව**
தேர்தல் ஆணைக்குழு
Election Commission

මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல 02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

LAE\2023**48** 2023.04.11

මැතිවරණ කොමිෂන් සභාව 2023.04.10 දින ගරු අග්‍රාමාත්‍යතුමා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් පාලන හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා ඇතුළු නිලධාරීන් සමග අග්‍රාමාත්‍ය කාර්යාලයේ දී පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළ කරුණු සම්බන්ධව සාකච්ඡාවක් පවත්වන ලද අතර එහි දී කොමිෂන් සභාව මතු සඳහන් කරුණු ගරු අග්‍රාමාත්‍යතුමාගේ අවධානයට යොමු කරන ලදී.

- මැතිවරණ කොමිෂන් සභාව සහ තේරීම්භාර නිලධාරීන්ට එරෙහිව පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සම්බන්ධව පවරා ඇති නඩු සම්බන්ධව නීතිපතිවරයා පෙනී නොසිටීමේ ස්ථාවරය වෙනස් කොට එම නඩු කටයුතු සඳහා නීතිපතිතුමා නියෝජනය කිරීමට කටයුතු සලසා දීම.
- පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා අවශ්‍ය මුදල් ලබාගැනීම සඳහා සහ ඒ සඳහා නිශ්චිත කාලරාමුවක් ලබාදීමට හා පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ මූලික කටයුතු වෙනුවෙන් පෞද්ගලික අංශයෙන් ලබාගෙන තිබෙන කාර්යයන් සඳහා ගෙවීමට තිබෙන වියදම් පියවීම සඳහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබා ගැනීමට මැදිහත් වීම.
- ඡන්ද විමසීම සඳහා නාමයෝජනා බාර දී තිබෙන දේශපාලන අයිතිවාසිකම් හිමි රාජ්‍ය/ ව්‍යවස්ථාපිත මණ්ඩල නිලධාරීන් සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් මත ගෙවනු ලබන මූලික වැටුප පැහැදිලි කිරීම හා ඡන්ද විමසීම කල් දැමීම මත එම නිලධාරීන් අපේක්ෂකත්වය දරන කොට්ඨාසයෙන් බැහැර කොට්ඨාසයක නැවත සේවයේ යෙදවීමට ක්‍රියා කිරීම.

මේ සම්බන්ධව කඩිනමින් සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙස අග්‍රාමාත්‍යතුමා විසින් අගමැති ලේකම්වරයාට උපදෙස් ලබා දෙන ලදී.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

**එච්.එම්.ටී.ඩී. හේරත්**
ලේකම්
මැතිවරණ කොමිෂන් සභාව